උපැටුම රේමන්ඩ් ලෝටා (Raymond Lotta) ගෙනි.

# ධනවාදය යටතේ සෞඛ්‍ය සත්කාරය, සමාජවාදය යටතේ සෞඛ්‍ය සත්කාරය

2009, සැප්තැම්බර් 29 දින රේමන්ඩ් ලෝටා ගේ වෙබ් අඩවියේ විකාශනය වූ කතාවේ පහත සඳහන් උපුටා ගත් කොටසින් (එනම් සැඟවුණු ලෝක ආර්ථික අර්බුදය: ක්‍රමය බිඳ වැටීම සහ විප්ලවයේ අවශ්‍යතාව) ඔහු සාකච්ඡා කරන්නේ ජනතාවට සෞඛ්‍ය සත්කාරය සපයා දීම සම්බන්ධයෙන් පවතින ක්‍රමයේ අසාර්ථකභාවයේ යටින් ඇත්තේ කුමක්ද යන්නයි; එමෙන්ම සැබෑ නිදහස්කාමී සමාජයක් ගොඩ නැගීමේ සන්දර්භය තුළ මෙම වැදගත් ප්‍රශ්නය සඳහා සමාජවාදය ඊට ආමන්ත්‍රණය කළ හැකි වන්නේ කෙසේද? ප්‍රකාශනයේ පහසුව පිණිස මෙය තරමක් සංස්කරණය කර ඇත.

මා දැන් කථා කිරීමට යන්නේ එක්සත් ජනපදයෙහි සෞඛ්‍ය සත්කාරය පිළිබඳ විවාදය දැවැන්ත පොදු සංසිද්ධියක් වීම ගැනයි. මෙය ක්‍රමයේ හරය වෙත දැඩිව කේන්ද්‍රගතවන බැවින්, ඒ පිළිබඳව මට යමක් පැවසීමට අවශ්‍ය යි. මෙහි ඔබට අවස්ථාවක් තියෙනවා; ඒ නිසා ඒ ගැන සිතන්න; එතැන ඔබ වැඩ කළ යුතු වෙනවා; නැතිනම් ඔබට, සෞඛ්‍ය සත්කාරයක් ලබා ගැනීමට, සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තියක් තිබිය යුතු වෙනවා; (ශ්‍රම බලකායෙන් 10% ක් තරම් විරැකියාවෙන් පෙළෙනවා) මෙය ආදි කල්පිකයි; මෙය වනාහි ඩයිනෝසරයන්ගේ යුගය මෙනි. ඒ නිසා සිතන්න. සෞඛ්‍ය සත්කාරය වනාහි සමාජයක මූලික වගකීමකි; මෙහි යෝග්‍යතාවයන් ගැන චෝදනාත්මකව විවේචන තිබෙනවා; පෞද්ගලික අයිතියට සියල්ල නැඹුරු වෙනවා; නිෂ්පාදන මාධ්‍යයන් සියල්ල පාලනය කරනවා; ආර්ථික සංවිධාන සියල්ල මෙහෙය වනවා. මෙහි අතු රිකිලි හඳුනා ගන්නේ කුමකින්ද? ලාභය; වාසිය මගිනි.

ඔබට අවස්ථාවක් මෙහි තිබෙනවා; හාවර්ඩ් වෛද්‍ය අධ්‍යයනයකට අනුව, මෙය නිව්යෝර්ක් 'Time' සඟරාවේ පළ විය; මිනිසුන්ට සෞඛ්‍ය රක්ෂණ නොමැති නිසා එක්සත් ජනපදයේ වසරකට අනවශ්‍ය මරණ 45,000 ක් පමණ සිදු වෙනවා. දැන් ඇමෙරිකාවේ සෞඛ්‍ය රක්ෂණ අහිමි ජනතාව මිලියන 45 ක් වෙනවා. ඔබාමාගේ සෞඛ්‍ය සැලැස්මේ සමහර විට සෞඛ්‍ය සත්කාර විවාදවල ප්‍රතිඵලයක් යටතේ, රක්ෂණ අහිමි ජනයා ලාභදායී පෞද්ගලික රක්ෂණ ආයෝජකයන්ගේ සංචිතවලට ගාල්කර බලාගන්නට යනවා විය හැකිය.

ප්‍රලේඛණගත නොවූ කම්කරුවන්ට සෞඛ්‍ය සත්කාරය ලැබේද නැද්ද යන්න පිළිබඳ, මෙම පාර්ශවයේ මුඛ්‍ය කරුණ වටා භ්‍රමණය වන සෞඛ්‍ය සත්කාරයේ ඊනියා විවාදයක් පිළිබඳ ඔබට ඇත්තේ අසම්මත හාස්‍යජනක මෙන්ම අශ්ශීල, නින්දිත ආකර්ෂණාත්මක ප්‍රදර්ශනයක් ය. නැවතත් එය මනුෂ්‍යත්වයේ අංශයක් ලෙස ප්‍රසාරණය විය හැක්ක කි. මෙහිදී ස්ත්‍රීන් විසින් ඉල්ලා සිටින ගබ්සාවට මුදල් දෙයි ද - සත්කාරය, දයාව මෙන්ම යුක්තිය ඉල්ලා සිටින අවස්ථාවක ඕනෑම විචාරශීලී උන්මත්තක නොවන මධ්‍යස්ථ සමාජයකට එවැනි දේවල් ඉටු කිරීම සහතික වේ. නමුත් පුරුෂ ආධිපත්‍යය හා ප්‍රබල ජාතික ස්වෝත්තමවාදය (Chauvinism) සමග වේගයෙන් යන එමෙන්ම ලාභ තර්කනය මත දිවෙන සමාජයක ඒවා එසේ සිදු නොවේ.

මේ සමාජයේ අරුම පුදුම ප්‍රජාතන්ත්‍රික දේශපාලනික ව්‍යුහ වල සීමාව තුළින් මෙයට කන් යොමු කරමු. දැන් වාර්ථාවක් සකස් කර තිබෙනවා - කොන්ග්‍රසයේ සෑම සාමාජිකයකුටම, ඖෂධ හා සම්බන්ධ මෙන්ම ''සෞඛ්‍ය සත්කාර මෙහෙයවන කර්මාන්ත හා සමිගම්'' වලින් වෘත්තීය පෙළඹවීම් කරන පුල්ගලයින් අට දෙනෙක් සම්බන්ධ වී සිටිනවා. ඔව්, සෞඛ්‍ය සත්කාර කර්මාන්ත, එනම් එය නාමාවලියක් වෙනවා, එය ආයෝජන අංශයක්. ඒ වනාහි සෞඛ්‍ය සත්කාරය නොව, සමාජමය අවශ්‍යතාවයක්ද නොවන්නේමය. එය සමාජ වගකීමක්ද නොවේ; එය වෙළඳ ව්‍යාපාරයක් වෙයි. එය සෞඛ්‍ය සත්කාර කර්මාන්තයයි. කොන්ග්‍රසයේ එක් ව්‍යවස්ථාදායක වරයෙක් සඳහා සෞඛ්‍ය කර්මාන්තවල වෘත්තීය පෙළඹවීම් කරන්නන් 8 දෙනෙක් ඉන්නවා. මේ වනාහි නව වාර්ථාවක්. (උපහාසාත්මකව): ඉදින් ඔබට ඇත්තේ අති දක්ෂිණාංශික පිස්සුවක්; ''මම බොහොම හොඳින්''. ''මම නිරෝගීව ඉන්නවා''. ''මම ඔය මළපහ ජහ ජරාව කාටවත්, කොහේවත් දාන්නෙ නෑ, ඕවා ඉතින් නොමිලේ පටවන ගොඩවල්.'' අපේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව නගරශාලා රැස්වීම් වල මෙය ඉතා වැදගත්සේ හඬ නැංවූ මතය යි.

ඔබ දන්නවද, මෙය යම් ආකාරයක අනාවරණයක්, මම අහල තියෙනවා සෞඛ්‍ය සත්කාරය ගැන විශේෂ CNN සංසදයෙන්; මම, සංජෙයි ගුප්තා කියනවා අහල තියෙනවා; ඔබ එයාව හඳුනනවා ඇති. ඔහු තමයි CNN එකේ සෞඛ්‍ය පිළිබඳ විශේෂඥයා. රෝග නිවාරක සත්කාරය පිළිබඳ යොමු වීම අර්ථවත් නොවන්නේද? යි, එක් අවස්ථාවක ඔහුගෙන් අසා තිබෙනවා, එය වටමේස සාකච්ඡාවලට වාඩිවන උදවිය ඉදිරියේ තැබිය යුතු වූ ප්‍රශ්නයක්; ඔබ දන්නවා, එතැන ඔවුන්ට හිටියේ කථා කරගෙන ගිය ඔළු ගෙඩි ටිකක්: යම් කෙනෙක් මෙය කළා. එවිට ඔහුගේ පිළිතුරු වූයේ; මට සිදුවුණා වගේ සටහන් ගෙන අරගෙන ඒක ලියා ගන්න, ''වෛද්‍ය හා ආචාරධාර්මික ආකල්පයකින් ඔව්, ඉන් අර්ථගැන්වෙන්නේ, රෝග නිවාරක සෞඛ්‍ය සත්කාරය වෙත වඩා අවධාරණය කිරීමයි.'' නමුත් යටින් දිවෙන සත්‍යය, ''එය එසේ නොවේ;'' පසුව තව කෙනෙක් දැක්වූයේ, අපි වඩාත්ම ප්‍රාථමික සත්කාරක වෛද්‍ය වරුන් පුහුණු කරමින් සිටිනවා සේ පෙනී යන බවයි; එවිට ගුප්තාද එවැනිම ප්‍රතිචාරයක් දැක්වූයේ, ''හොඳයි, වෛද්‍ය විද්‍යාත්මක හා ආචාරධර්මිකව, ඉන් සංවේදීතාවක් ඇති වෙනවා, නමුත් ඇත්ත තත්ත්වය නොවේ'' යන්නයි.

එමෙන්ම ඔබ දන්නවා, ගුප්තා කිසියම් දෙයකට සම්බන්ධව ඉන්න බව, මගේ දැනීමට අනුව ඔහු මාක්ස්වාදියෙක් නොවේ (උත්ප්‍රාසාත්මක ස්වරයෙන් කථා කරමින්) මා ඇසුරු කරන මාක්ස්වාදී වෙබ් අඩවිවලට ඔහු කිසිදා ලියා නැත. එසේ නමුත් ඇත්ත වශයෙන්ම සමාජ අවශ්‍යතා, සමාජමය සෞඛ්‍ය හා පැහැර හැරිය නොහැකි ලාභය අතර මූලික ඝට්ටනයක් පවතිනවා. එම නිසා ඇත්තෙන්ම මම සිතන්නේ අප ඉදිරියේ වඩාත්ම දර්ශනය වන මූලික අවශ්‍යතා සහ ඇත්ත තත්ත්වය (bottom line) අතර පවතින ඝට්ටනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි.

සමාජවාදය සිදු කරන වෙනස මෙයයි. ලාභය සිතුවිට පාවිච්චිය සඳහා සූදානම් තත්ත්වයක තව දුරටත් නොපවතියි. එවැනි වූ ඇත්ත තත්ත්වයක් නොපවතී. සමාජවාදය යටතේ ආර්ථිකය ඔබ සඳහා පවතිනවා; ආර්ථිකය සකස්වන්නේ ජනතාවට සේවය කිරීම සඳහායි; සමාජවාදී ආර්ථිකය සම්පත් හා විශේෂඥයන් යොදවන්නේ ඒවා වඩාත් අවශ්‍ය වන්නා වූ ස්ථානවලට යි. එසේම එය ජනතාවට සේවය කරනවා; ලෝක ප්‍රජාවගේ අවශ්‍යතාවන්ට සේවය කරනවා. නැවත හැරෙමු සංජෙයි ගුප්තා වෙතට; මේ තමයි සමාජවාදී සමාජයේ ආචාර ධර්ම.

දැන් මට අවශ්‍යයි තරමක් පැහැදිලි කරන්න; සමාජවාදය යටතේ අපි සෞඛ්‍ය සත්කාරය සංවිධානය කරන්නේ කෙසේද කියලා; ඒ සඳහා ඇත්ත වශයෙන් මම ජනතාව උනන්දු කරන්නේ කෙසේද කියලා; ඒ සඳහා ඇත්ත වශයෙන් මම ජනතාව උනන්දු කරන්නේ බොබ් අවේකියන් විසින් සම්පාදිත DVD පටයට සවන් යොමු කරන ලෙස, එහිදී ''බලන්න-සිතන්න (Imagine) යන මාතෘකාව යටතේ එන කොටසේ ඔහු මේ ගැන පැහැදිලි කරනවා. මා කතා කරමින් සිටින ප්‍රතිපත්ති මත පදනම් වූ සමාජයක වෙනස්ම ආකාරයකට අපට කටයුතු සිදු කළ හැකිවෙන්නේ කෙසේද යන්න ගැන සිතා බලන්න. මෙම DVD පටය ''Revolution Online වෙතින් ලබා ගත හැකියි: එය අනිවාර්ය වන්නේ මන්ද?, එය සිදු කළ හැකිවන්නේ කුමක් නිසාද? මේ සියල්ල කුමක් අරභයාද? සමාජවාදය යටතේ එය කළ හැකි වෙන්නේ කෙසේද?

සමාජවාදය යටතේ සමාජය නැවත ගොඩ නැගීම පිණිස සමස්ත කුසලතා, දැනුම හා නිර්ණයන් මෙහෙයවමින්ද, සජීවිකරණය කරමින්ද, බහුමානීය ආකාරයෙන් ප්‍රශ්න, ගැටළු විසඳා ගැනීමට ජනතාව බලාත්මක කරන්නාවූ නව දේශපාලන ක්‍රමයක් ඔබ සතුව පවතියි. විශේෂඥයින් සහ විශේෂඥයින් නොවන්නන් අතර පවතින සීමා මායිම් බණ්ඩනය කිරීම සඳහා සවිඥානිකව අපේක්ෂා කරන සමාජයක් ඔබට ඇත, එහිදී වෛද්‍යවරු රෝගීන්ගෙන් උගනී, ඇත්තෙන්ම ඔවුන්ට ඇහුම්කන් දෙති. ඔබ සතුව පවතින වෛද්‍ය පුහුණුව අනුව සමාජයේ හා ලෝකයේ අවශ්‍යතා හා ආබද්ධව වෛද්‍යවරුන් ස්ථානගත කරයි. මූලික ජන කොට්ඨාශ අතර වෛද්‍ය ඥාණය, ඔබට පතුරුවා හැරිය හැකිවෙයි; විශිෂ්ඨ පුහුණුවක් ලත් සහ අවම පුහුණුවක් ලත් ජනයා ආබද්ධ කිරීම නිර්මාණය කළ හැකිය.

ඔබ සෞඛ්‍ය ගැටළුවලට ප්‍රතිකාර කළ යුතු වන්නේ සමෝධානික ආකාරයටය; ජනතාව වැඩ කරන අන්දම හා ස්ථාන, එමෙන්ම ඔවුන් ජීවත්වන ස්ථාන හා සම්බන්ධ වෙමින්ය; පරිසර ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු හා සම්බන්ධව ඔබ කටයුතු කරයි; යෝග්‍ය සමාජ විමර්ෂණ්‍ය ඔබ දියත් කරයි; කාන්තාවන්ගේ හා සුළු ජාතීන්ගේ විශේෂ අවශ්‍යතා කෙරෙහි ඔබ අවධානය යොමු කරයි. ඉතා දියුණු සමීක්ෂණ සමග ගවේෂණය හා අත්හදා බැලීම් පිළිබඳ ක්‍රියාදාමය තුළට ජනතාව සෘජුව ආකර්ශනය වන්නාවූ මූලික බිම් මට්ටමේ සමීක්ෂණ, ඔබ ආබද්ධ කරයි.

රෝහල් හා සායන හෝ වෛද්‍ය පාසල් ද, යන වෛද්‍ය ආයතන තුළ කළමනාකරණය හා තීන්දු, තීරණ ගැනීම තව දුරටත් වරප්‍රසාදලත් හා පාලනය හසුරුවන අතලොස්සක් අත නොපවතිනු ඇත. පරිපාලකයින්, වෛද්‍යවරුන්, හෙදියන්, වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලෙන්නන්, වෛද්‍ය ශිෂ්‍යයින්, සහ ජනතා නියෝජිතයින් ආබද්ධකරණය හා එය සම්බන්ධ වේ. සමාජයේ සෑම මට්ටමකදීම, මූලික ජනයා සහභාගිවේ; එමෙන්ම වගකීම් දරන්නේය.

සමාජවාදී සමාජය සදාකාලිකවම තහනම් කරනු ලබන එක් දෙයක් නම් AIDS එන්නත්, හෝ මැලේරියා ප්‍රතිකාරයේ නවාකාරයන් වැනි ඔසු හා බෙහෙත් වර්ග මෙන්ම ප්‍රතිකාර කෙරෙහි පවතින පේටන්ට් දේපළ හිමිකාරිත්වයේ අපරාධවල යටින් දිවෙන ඇත්ත තත්ත්වයයි. මේ දැනුම් සම්භාරය, ප්‍රධාන සොයා ගැනීම් හා ඉදිරි වර්ධනයන්, මෙවැනි ඔසු වර්ග ලෝක ප්‍රජාව අතට පත් කිරීම් කටයුතුවලට උර දෙනු ලබයි: ඊට වෙනස්ව මෙසේ දක්වමු: දැවැන්ත ඔසු විකුණුම් හල් රෝග ප්‍රතිකාර මගින් ලාභ උපදවා ඖෂධ නිෂ්පාදන සමාගම් වැනි දේවල් සමාජවාදය යටතේ නොපවතියි.

දැන් අපි නැවත මතක් කරමු මෙය වනාහි මනෝරාජ්‍යයක් නොවන බව. එය ඉතාම ජීව්‍ය ය; සාධ්‍ය ය. නමුත් එය සිදු විය හැකි වන්නේ ඔබ සතුව වෙනස් ආකාරයක ආර්ථිකයක් සහ වෙනස් රාජ්‍ය බලයක් තිබෙන අවස්ථාවකය. ඒ වගේම එය ඉෂ්ඨකර තිබුණා-මාඕවාදී චීනයේ- විශේෂයෙන්ම සංස්කෘතික විප්ලව කාල වකවානුවේ.

මාඕවාදී චීනය පොහොසත් රටක් නොවීය. නමුත් එක්සත් ජනපදයට ශාක්ෂාත් කර ගැනීමට ආසන්නයට වත් ලගාවිය නොහැකි දෙයක් චීනයට නිර්මාණය කළ හැකි විය: එනම් ඒ විශ්වීය සෞඛ්‍ය සත්කාරය ක්‍රමයය යි. නොමිලේ හෝ අවම මිලකට සෞඛ්‍ය සේවාවන් සපයා තිබුණි; සෞඛ්‍ය සත්කාර ක්‍රමය මෙහෙයවන ලද්දේ සහයෝගිතාවයේ හා සමානාත්මතාවයේ ප්‍රතිපත්ති විසිනි.

චීනය සැබැවින්ම සමාජවාදී රටක්ව පැවැති සමයේ, රෝග නිවාරණයට සනීපාරක්ෂණ විද්‍යාව, සහ පොදු ජන මිණුම් දඬු කෙරෙහි අවධාරණය කළේය. වසර 15 කින් චීනයට කොළරා, සරම්ප වැනි වසංගත රෝගාබාධ මැඩ පැවැත්වීමට හැකි විය. අබිං වලට ඇබ්බැහිවීමේ ගැටලුව සමනය කිරීමට ජනතා ව්‍යාපාරයක් දියත් කළේය. සමාජවාදී චීනයේ සෞඛ්‍ය සත්කාරය සම්බන්ධ වැදගත් මෙන්ම අර්ථ දක්වන ලක්ෂණ වලින් එකක් වූයේ කෘත මුල් මට්ටමේ සෞඛ්‍ය ගැටළුවලදී ප්‍රජා සහභාගිත්වය හා ජනතාව වෙත වගකීම බාර කිරීම උපරිම කරණය කිරීම නිසාය. සම්පත් වෙන් කිරීමේ සංකේන්ද්‍රණයත්, අති විශාල ප්‍රමාණයක විකේන්ද්‍රණයත් යන දෙකම තිබුණා, එමෙන්ම අසල් වැසි රටවල ජනතාව හා ප්‍රජාවන් කෙරෙහි විශ්වාසයක්ද තිබුණි. මහ ජනතාව සජීවීකරණය සිදු කරනවාත් සමගම, මහ ජන අධ්‍යාපනයක්ද වීය.

චීන සෞඛ්‍ය ක්‍රමය කටු චිකිත්සාව සහ ඔසු පැළෑටි වැනි දේශීය ප්‍රතිකාර හා සම්ප්‍රදාය හා සබැඳි නූතන ප්‍රතිකාර සමග ආබද්ධ විය. විප්ලවීය චීනය තුළ ජනතාව අතර ප්‍රචලිත වූ සටන් පාඨය වූයේ ස්වකීය වාසිය හා ආත්ම ලාභය සාක්ෂාත්කරණයට විරුද්ධව, ජනතාවට සේවය කිරීම විය. වෛද්‍යවරු ප්‍රගුණ කළ ජීව ගුණය වූයේ එයයි. මෙම ක්‍රමයේ සාර්ථකත්වය ලාභ ලැබීම හෝ පිරි වැය හෝ විරුද්ධ මත පැතිරීම වැළැක්වීම විසින් මැන බැලීම සිදු නොවන ලදි. නමුත් නව හා විමුක්තිකාමී සමාජයක් ගොඩනැගීමේ මාධ්‍යයක් වශයෙන් සමාජ සෞඛ්‍ය හා සමාජ සුභ සාධනය මැන බැලෙයි. සමාජ සුභ සාධනය-මහජන සෞඛ්‍ය සහ ජීවිතයේ සමස්ත ගුණාත්මක බව එම සමාජයේ වැදගත්ම නිශ්ඨාව වෙයි. සංස්කෘතික විප්ලවය

සමය තුළ, සෞඛ්‍ය සත්කාර පිරිවැය කෙරෙහි අවධානය යොමුවිය, සම්පත් වෙන් කිරීම, පිටිසරබද පළාත්වලටද විතැන් කළේය; සමස්ත සෞඛ්‍ය සත්කාරය නගරවලද දියුණු කළේය.

කිසියම් කාලයක් සඳහා නාගරික වෛද්‍ය වරුන්ගෙන් 1/3 පමණ අවශ්‍යතාව මත ග්‍රාමීය ප්‍රදේශවල සේවයේ යොදවා තිබුණි. සංස්කෘතික විප්ලවයේ වඩාත් උත්කෘෂ්ඨ සංවර්ධනය වූයේ පාවහන් රහිත වෛද්‍යවරුන්ගේ ව්‍යාපාරය විය. ප්‍රාදේශීය අවශ්‍යතා පිරිමසාලනු වස් මූලික සෞඛ්‍ය සත්කාරය හා බෙහෙත් පිළිබඳ කඩිනමින් පුහුණු කරන ලද ග්‍රාමීය ගොවි තරුණයින් සහ නාගරික තරුණයින් පිටිසරබද පළාත්වලට පිටත් කර යැවීමයි; ඔවුන් පොදු රෝගාබාධවලට ප්‍රතිකාර කිරීමේ හැකියාවෙන් යුක්ත වූ පිරිසක්ද වූහ.

ප්‍රතිඵල මහත්සේ විස්මිත විය. මාඕ බොහෝ මරණ සිදු කළ බවට අභූත හා නිරවද්‍යතාව ඔප්පු කළ නොහැකි චෝදනා ඔහුට එල්ල කරන බව ඔබ අසා ඇත. නමුත් 1949 දී ආයු කාලය අවුරුදු 32 සිට අවුරුදු 65 දක්වා 1976 වන විට දෙගුණයක් දක්වා වර්ධනය කළේ මාඕ සේතුං සහෝදරයාගේ සමාජවාදී පාලන කාලයේය. 1970 ගණන්වල මුල් කාලයේ ෂැංහයි වල ළදරු මරණ අනුපාතය නිව්යෝර්ක් නගරයේ සිදුවන ළදරු මරණ අනුපාතයට වඩා බොහෝ පහත් මට්ටමක පැවතිණ.

පළමු සමාජවාදී විප්ලවීය රැල්ලේ උරුමය මෙසේ සිදු වීය; අපට එයින් පාඩම් උගත හැකිය, ගොඩ නැගිය හැකිය. මීළඟ සමාජවාදී විප්ලවීය රැල්ල අපි මින් ඉදිරියට රැගෙන යනු ඇත. වඩාත් ප්‍රශස්ත මට්ටමකින් එය සිදු කළ හැකිය.

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
T 09

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com